## 347 රැයෙහි අහසෙ

රැයෙහි අහසෙ හඳ දිලෙන්නෙ
හඳ එළියේ අපි රඟන්නෙ
ජේසු ඔබයි එතැන ඉන්නෙ
ජේසු මටයි සතුට දුන්නේ

බණ්ඩි ගොයම අර වැනෙන්නෙ
සීත සුළං රැළි නැඟෙන්නෙ
ජේසු ඔබයි එතැන ඉන්නෙ
ජේසු මටයි රසය දුන්නෙ

වෙල් යායේ එහා පැත්තෙ
ගලන ඔයේ සිසිල ඇත්තෙ
ජේසු ඔබයි එතැන ඉන්නෙ
ජේසු මටයි සිසිල දුන්නෙ

බට්ටි කුරුල්ලන් රෑනක්
වෙලට උඩින් පියාඹන්නෙ
ජේසු ඔබයි එතැන ඉන්නෙ
ජේසු මටයි මිහිර දුන්නෙ